# ජන සෙත සැලසීමට කෘෂි අතුරු නිෂ්පාදන

කෘෂිකර්ම ක්ෂේත්‍රය, ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගනී. එය ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමට 25% ක් පමණ දායක වන අතර, රැකියා වල යෙදී සිටින ජනතාවගෙන් 50% ක් පමණ දෙනා උදෙසා රැකියා සපයයි. මෙම සංඛ්‍යා වලින් අපට පැහැදිලිව පෙනෙන්නේ, මේ රටේ ජීවත් වන ජනතාවට කෘෂි සම්පත් ඉතා වැදගත් බවයි. ජනගහනයෙන් 80% ක් පමණ ගම්බදව ජීවත් වීමත් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂි කර්මාන්තය වීමත් නිසා මෙම අංශයේ වැදගත් කම තවත් තහවුරු කරයි.

දිනෙන් දින ජනගහනය වැඩි වීමත් සමඟ, කෘෂිකර්මය දියුණු කිරීමට ඇති ප්‍රධාන බාධකයක් නම්, ප්‍රධාන කෘෂි සම්පත වන ඉඩම් සීමිත වීමය. මෙවැනි තත්ත්වයක් බිහිවීමේ දී අපට දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් ගම්බද ජනයා රැකියා සොයා නගරවලට ඇදී යාමයි. මේ හේතුව නිසා උගත් තරුණ තරුණියන්ගෙන් ගම්බද හීනවන අතර, නගරවල රැකියා විරහිත අයගේ ප්‍රමාණයද වැඩි වේ.

මෙවැනි තත්ත්වයකින් මිදීමට නම් ගම්බදව ම රැකියා බිහි කිරීමට තැත් දැරිය යුතුවේ. පෙර සඳහන් කළ පරිදි ඉඩම් හිඟය නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට බාධකයක් වනු පමණක් නොව වැඩි දෙනකු කෘෂි නිෂ්පාදනයේ යෙදීමට ද බාධකයක් ලෙස ද ක්‍රියා කරයි. මෙවැනි අවස්ථාවකදී නව තාක්ෂණයෙන් නිෂ්පාදනය වැඩි කිරීම එක් පිළියමකි. අනික් අතින් අප වැඩි උනන්දුවක් නොදැක් වූ පිළියමක් ද ඇත. එනම් කෘෂිකාර්මික අතුරු නිෂ්පාදන වඩා කාර්යක්ෂමව භාවිතා කිරීමයි. ගම්බදව ඉතා බහුලව දක්නට ලැබෙන මුත්, මෙතෙක් ආර්ථික වශයෙන් එතරම් ප්‍රයෝජනයට නොගෙන ඇති කෘෂි අතුරු නිෂ්පාදන සමහරක් නම්; පිදුරු, කෙසෙල් කඳන්, හාල් නිවුඩු, ගොම හා කුකුල් පොහොර, කොල හා අතු කැබලි වේ. මෙම අපද්‍රව්‍ය ආර්ථිකමය වටිනාකමක් ඇති භාණ්ඩ හෝ ද්‍රව්‍ය වලට පරිවර්තනය කිරීමෙන් වැඩි රැකියා බිහිවීමක් ඇති වීමට අමතරව, ගම්බද කර්මාන්තවලට ට සේවා අංශයක් ඇති වීමෙන් අමතර රැකියාවන් ද බිහිවනු ඇත.

කෙසේ වෙතත් මෙවැනි සුළු පරිමාන කර්මාන්ත ආරම්භ කිරීමට ප්‍රථම සැලකිය යුතු කරුණු දෙකක් ඇත. එනම් කර්මාන්තයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූල ධනය සොයා ගැනීම සහ නිෂ්පාදන වලට අඛණ්ඩ වෙළඳ පොලක් තිබීමයි. මෙහි පළමු ප්‍රශ්නයට ජන සවිය ව්‍යාපාරය ඉමහත් උපකාරයක් වනු ඇත. විශේෂයෙන් ජනසවියට සහභාගි වන අය, සාමූහිකව ක්‍රියා කරන්නේ නම් සමූපකාර සංකල්පයක් මත කුඩා කණ්ඩායම් වශයෙන් එකතුවී අවශ්‍ය මුදල් සොයා ගැනීමට හැකි වනු ඇත. ඒ කෙසේ වෙතත් අඛණ්ඩ වෙළඳ පොලක් සොයා දීම රජය සතු වගකීමක් විය යුතුයි.


ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**ආචාර්ය ෆ්‍රෙඩ්රික් අබේරත්න විසිනි**


ආර්ථිකමය වටිනාමකක් ඇති අප ද්‍රව්‍ය කිහිපයක් ගැන අවධානය යොමු කරමු. වී වගාවේ අතුරු පලයක් වන පිදුරු සුළු වශයෙන් කඩදාසි කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන නමුදු සම්පූර්ණ පිදුරු ප්‍රමාණය ආර්ථික නිෂ්පාදන වලට හැරවීමක් පෙනෙන්නට නැත. අප නිතර දක්නා දර්ශනයක් නම් කුඹුරු සම්පව ගිනි තබන ලද පිදුරු ගොඩවල් ය. එනෙත් පිදුරු වලින් ප්‍රයෝජන කිහිපයක් ලබා ගත හැක. විශේෂයෙන් සෝදා පාළුවට භාජනය වන ඉඩම් වල ගොවිතැන් කිරීමට පිදුරු ඉතා හොඳ වසුනක් ලෙස භාවිතා කල හැකිය. එසේ ම කුඹුරු හැමේදී පසට පිදුරු කලවම් කිරීමෙන් පොහොරක් ලෙස ක්‍රියා කරන අතර පසේ ව්‍යුහය ද දියුණු කරයි. රැකියා විරහිත පුද්ගලයන් කණ්ඩායම් ලෙස එකතු වී විවිධ ආර්ථික කාර්යයන් සඳහා පිදුරු එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම රැකියාවක් කර ගැනීමට හැකිය. දැනටමත් සමහර ට්‍රැක්ටර් හිමියන් මෙවැනි ක්‍රියාවන් වල යෙදී සිටිනු දක්නට ලැබේ.

ආර්ථිකමය වශයෙන් නිෂ්පාදන වලට හැරවිය හැකි තවත් කෘෂි අතුරු නිෂ්පාදනයක් නම් කෙසෙල් කඳන්ය. කෙසෙල් කඳන් ඉතාමත් ශක්තිමත්, කෙඳි වර්ගයකින් සමන්විතය. මෙම කෙඳි භාවිතා කර ලණු හා නොයෙකුත් කෙඳි භාණ්ඩ නිෂ්පාදනය කළ හැක. මීට වසර කිහිපයකට පෙර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රදේශයේ මෙවැනි කර්මාන්තයක ආරම්භ කරන ලද නමුදු, අඛණ්ඩ වෙළඳ පොපොලක් නොමැති කමින් එය එතරම් සාර්ථක වූයේ නැත. එමනිසා රජය හෝ වෙනත් ආයතනයක් මගින් අඛණ්ඩ වෙළඳ පොලක් සොයා දෙන්නේ නම් මෙවැනි සුළු පරිමාන කර්මාන්ත වලින් රැකියා ලබා දීමට හැකි වනු ඇත. එසේම කෙසෙල් කඳන් වලින් පිෂ්ඨමය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හැකි බව ඉන්දියානු පර්යේෂකයන් පෙන්වා දී ඇත.

දිනෙන් දිනම ලෝක වෙළඳ පොලේ ඛණිජ තෙල් මිල ඉහල යාමත් සමඟ කෘත්‍රිම පොහොර වල මිල ද ඉහල යන හෙයින් කෘෂි නිෂ්පාදන වියදම් ද ඉහල යනු ඇත. මෙවැනි තත්ත්වයක් ඇති අවස්ථාවක දී කෘත්‍රිම පොහොර වෙනුවට, වෙනත් කාබනික පොහොර හැකි පමණ භාවිතය ඉතා සුදුසුය. ජෛවීය පොහොර ගණයට වැටෙන ප්‍රධාන පොහොරක් නම් කොම්පෝස්ට් පොහොරයි. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට එදිනෙදා දක්නට ලැබෙන කෘෂිකාර්මික අතුරු නිෂ්පාදන බොහොමයක් භාවිතා කල හැක. මේවා අතුරින් ඉවත දමන ලද කොල හා වෙනත් ශාක කොටස්.

( 8 වන පිටුවට )

ජන සෙත සැළසීමට.....

(6 වෙනි පිටුවෙන්)

සහ ගොම පොහොර ප්‍රයෝජනයට ගත හැක. මේවා එකතු කිරීම තරමක වෙහෙසක් දැරිය යුතු කාර්යයක් නමුත් අඛණ්ඩ වෙළඳ පොලක් ඇත්නම් එය ආර්ථිකමය නිෂ්පාදනයක් වනවාට නොඅනුමනය. විශේෂයෙන් ගෙවතු වගා කරන්නන්, හෝ මල් නිෂ්පාදනය කරන අයගෙන්, කොම්පෝස්ට් පොහොර සඳහා ඉල්ලුමක් ඇත. එමනිසා මෙය සුළු පරිමාන ව්‍යාපෘතියක් ලෙස සලකා කුඩා කාණ්ඩවලට අතුරු රැකියාවක් ලෙස කිරීමෙන් අතිරේක ආදායමක් ලබා ගැනීමට හැකි වනු ඇත.

වෙළඳපොල ගැන සලකන විට දේශීය වෙළඳ පොල පමණක් නොව, විදේශීය වෙළඳ පොල ගැන ද සැලකිය යුතුයි. විශේෂයෙන් විදේශීය වෙළඳ පොල සඳහා ලංකාවේ ඉතා ලෙහෙසියෙන් නිෂ්පාදනය කල හැකි කෘෂි නිෂ්පාදන කිහිපයක් ඇත. එහෙත් මෙහි දී අවධානය කළ යුතු කරුණක් නම් නිෂ්පාදනය ආරම්භ කිරීමට පෙර වෙළඳ පොලක් තිබේ ද යන්න හොඳින් සොයා බැලීමය. උදහරණයක් ලෙස පැපොල් කිරි වලින් ලබාගත හැකි ''පැපෙන්'' වලට හොඳ විදේශීය වෙළඳ පොලක් ඇත. එසේ ම ලුබුවර්ග සහ දේශීය පළතුරු වලට විදේශීය රටවල හොඳ ඉල්ලුමක් ඇත.

එමනිසා රටේ ආර්ථිකය ගොඩ නැංවීමට හා රැකියා බිහි කිරීමට අප ලෙහෙසියෙන් ඉවතලන කෘෂි කාර්මික අතුරු නිෂ්පාදන ආර්ථික භාණ්ඩවලට හැරවීමට මෙයට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කරන්නේ නම් එය රටට පලදයක වනු ඇත. □